පේරාදෙණිය විශ්වවිද්‍යාලය
பேராதனைப் பல்கலைக்கழகம்
**UNIVERSITY OF PERADENIYA**

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
தொலை தொடர் கல்வி நிலையம்
**CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION**

දෙවන වසර ශාස්ත්‍රවේදී උපාධි පරීක්ෂණය (බාහිර - නව නිර්දේශය)
නොවැම්බර් 2019
இரண்டாம் வருட கலைத்தேர்வு பரீட்சை (வெளிவாரி - புதிய பாடத்திட்டம்)
நவம்பர் - 2019
2nd YEAR (200 LEVEL) EXAMINATION IN BACHELOR OF ARTS (EXTERNAL - NEW SYLLABUS) NOVEMBER 2019

# SUPE -203
## ව්‍යවහාරික ආචාරවිද්‍යාව

ප්‍රශ්න පහකට (05) කට පමණක් පිළිතුරු සපයන්න.
කාලය: පැය (03) තුනයි.
මෙම ප්‍රශ්න පත්‍රයේ අඩංගු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 10කි.

---

01. ව්‍යවහාරික ආචාරවිද්‍යාවේ අරමුණු හා සමාජ උපයෝගීතාවය පැහැදිලි කරමින් එහි විෂය ක්ෂේත්‍රය පරීක්ෂා කරන්න.

02. **"ජාන ඉංජිනේරු තාක්ෂණය විවිධ ආකාරයේ ප්‍රතිලාභ අපට අත් කර දෙන්නේ නමුදු මානව ක්ලෝණීකරණය මානව සමාජය තුළ බරපතල ආචාරවිද්‍යාත්මක ගැටලු ඇති කරනු ඇත".** සාකච්ඡා කරන්න.

03. **එක්කෝ**
මරණීය දණ්ඩනය සමාජයෙන් ඉවත් කර දැමිය යුතු යැයි ඔබ කල්පනා කරන්නේද? පැහැදිලි කරන්න.
**නැත්නම්**
ළමා අපයෝජන සහ ළමයින් අපයෝජනයන්ගෙන් ආරක්ෂා කරගැනීමට ක්‍රම සහ විධි හඳුන්වා දෙන්න.

04. **"ගබ්සාව නීතිගත කිරීම කාලීන අවශ්‍යතාවයකි".** ඔබගේ පිළිතුරට හේතු දක්වමින් මෙම ප්‍රකාශය පිළිබඳ ඔබගේ ප්‍රතිචාරය පැහැදිලි කරන්න.

05. වර්තමාන ශ්‍රී ලාංකීය මාධ්‍ය භාවිතය තුළ දැවෙන ආචාරවිද්‍යාත්මක ගැටලු විචාරාත්මකව විභාග කරන්න.

අ.පි.බ.

06. **"හිපොක්‍රටීස් දිව්රුමෙහි"** එන සදාචාරාත්මක නීති **හතරක්** ලියා දක්වමින් වර්තමාන ගෝලීය වෛද්‍ය භාවිතය තුළ ඒවා කෙතෙක් දුරට අනුගමනය කිරීමට සමත් ව තිබේදැයි පරීක්ෂා කරන්න.

07. "සුබ මරණය" නමැති සංකල්පය ඔබ තේරුම් ගන්නේ කෙසේද? මෙම වෛද්‍ය භාවිතය අප රටට හඳුන්වාදිය යුතුද? ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න.

08. දික්කසාදය පිළිබඳ ලාංකීය නීති රාමුව වර්තමාන භාවිතයට වඩා නම්‍යශීලි විය යුතු යැයි ඔබ කල්පනා කරන්නේද? ඔබ එසේ සිතන්නේ ඇයිදැයි පැහැදිලි කරන්න.

09. **"සත්තු යනු මිනිසුන් සඳහාම උපන් වහලුන් නොවේ".** සත්ත්ව අයිතිවාසිකම්වලට ගරු කිරීමට මහජනයා පෙළඹවීමට පුවත්පතක් සඳහා ලිපියක් ලියන්න.

10. පහත දැක්වෙන ඕනෑම <u>හතරකට</u> කෙටි සටහන් ලියන්න.

- අ) වෙළඳ දැන්වීම් ආශ්‍රිත සදාචාරමය ගැටලු
- ආ) පාරිසරික ආචාරවිද්‍යාව
- ඇ) ක්‍රීඩාව සහ ආචාරධර්ම
- ඈ) අධ්‍යයන ආචාරධර්ම හා බුද්ධිමය දේපල
- ඉ) ආචාරවිද්‍යාව ඉගෙනීමෙහි වැදගත්කම
- ඊ) ලිංගික වරණය සඳහා ඇති අයිතිය